

# සාමය තුළින් සමෘද්ධියේ පහන් ටැඹ වෙත...

ආර්. ප්‍රේමදාස

BKT 0121
25|08|2023
ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# සාමය තුළින් සමෘද්ධියේ පහන් ටැඹ වෙත. . .

*1989යේ අප්‍රේල් මස පළමු වැනි දින*
*ගිරාඳුරුකෝට්ටේ පුරවරයේදී පැවති*
*ජාතික තරුණසේවා සභාව විසින් සංවිධානය කරන ලද*
*හයවැනි "යොවුන් පුර" සාංවත්සරික උළෙල අමතා*
***ශ්‍රීමත් ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමන්***
*විසින් පවත්වන ලද කථාව*

මේ හයවැනි යොවුන් පුරයයි. මේ අවස්ථා හයටම මම සහභාගී වෙලා තිබෙනවා. ඒ හැම අවස්ථාවකම මම වඩාත් තරුණ වුණ බව කෘතවේදිත්වයෙන් තමුන්නාන්සේලාට සඳහන් කරන්න කැමතියි. එයින් මම අදහස් කරන්නෙ ශරීරික වශයෙන් තරුණ වුණා කියන එක නොවෙයි; එහෙම වෙන්න පුළුවන්කමක් නෑ. අවුරුද්දෙන් අවුරුද්ද අපි වයසට යනව. තමුන් තමුන්නාන්සේලා වාර්ෂිකව හමු උනාම අදහස් උදහස් වශයෙන් තමුන්නාන්සේලාගේ යොවුන් සිතිවිලිවල ආකර්ශනයෙන් මා හැඟීම්වලිනුත් තරුණ වුණ බවයි මට ප්‍රකාශ කරන්න තිබෙන්නේ.

> සාමයක් රටක ඇති වන්න නම්,
> මෙත්තා, මුදිතා,
> කරුණා, උපේක්ෂා කියන
> සතර බ්‍රහ්ම විහරණය
> අප අනුගමනය කළ යුතුයි.

තමුන්නාන්සේලාගේ යොවුන් සවිය දකින යොවුන් උද්‍යොගය දකින තැවුම් අදහස් උදහස් ඇහෙන මටත් නැවතත් තරුණයෙක් වෙන්න හිතෙනව. මේ රටේ ජන වරමින් ජනාධිපති හැටියට පත්වෙලා. මා තමුන්නාන්සේලා හමුවන්නේ මහියංගණයේ 1989 පවත්වන යොවුන්පුරයේ දී පළමුවැනි අවස්ථාවට.

තමුන්නාන්සේලාගේ රාජ්‍ය ඇමතිතුමා කිව්වා තමුන්නාන්සේලා එතුමාට කළ ප්‍රකාශයක් යොවුන් නියෝජිතයෙක් එතුමාට කියල තිබුණා. "ඇයි, ඇමතිතුමා ඇතැම් උදවිය තරුණ අප දෙස වපර ඇසින් බලන්නේ" කියල. මම අද තමුන්නාන්සේලාට කියනව මගේ පාලන සමය තුළ දී තරුණ උදවිය දෙස වපර ඇසින් බලන එක නතර කරනවයි කියල. වපර ඇසින් බලනවයි කියන්නේ යම් කෙනෙක්ගේ ජාතිය, ආගම, කුලය, කතා කරන භාෂාව, පදිංචි ප්‍රදේශය, තමන් පිළිගන්න දේශපාලන මතය කියන්නා වූ මේ කාරණා අනුව භේද කාරී ලෙස ජනතාව දෙස බැලීමටයි. ඒ වාදභේද අනුව ඒ ප්‍රභේද අනුව තරුණ තමුන්නාන්සේලා දෙස පමණක් නොවෙයි, මේ රටේ සියළුම ජන කොටස් දෙස රජය, නිලධාරීන් බැලූ ආකල්පය මම වෙනස් කරන්නට අධිෂ්ඨාන කරන්න අදහස් කරගෙන සිටින බව මම තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්න සතුටුයි. තමුන්නාන්සේලා කුමන ප්‍රදේශයක ඉපදුනත්, තමුන්නාන්සේලා කුමන භාෂාවක් කථා කළත්, තමුන්නාන්සේලා කුමන ජාතියකට, ආගමකට, ගෝත්‍රයකට, කුලයකට අයිති උනත්, තමුන්නාන්සේලාගේ දේශපාලන මතය කුමක් උනත්, මීට පසුව තමුන්නාන්සේලාට සලකන්නේ තමුන්නාන්සේලාගේ දක්ෂ පක්ෂකම් අනුව බව මම තමුන්නාසේලාට අවධාරණයෙන් මතක් කරන්න කැමතියි. ඒක තමයි මම ජනතාව ඉදිරියේ තැබූ නව දර්ශනය. ඒක තමයි මගේ ජනතාව අනුමත කළ නව පිළිවෙත. මගේ ධජය දෙස බලන්න. සහෝදර සහෝදරියනි, නව ජනාධිපති ධජය මෙනන රූව පිළිරූව දෙනව. මේ ධජයෙන් මූර්තිමත් කරන්නෙ සාමය, සංවරය, සමෘද්ධිය. සාමයක් රටක ඇති වන්න

නම්, මෛත්‍රී, මුදිතා, කරුණා, උපේක්ෂා කියන සතර බ්‍රහ්ම විහරණය අප අනුගමනය කළ යුතුයි. මේ ධජයේ කොන් හතරේ තිබෙන බෝපත් හතර සංකේතවත් කරන්නෙ, කෙනෙක්ගෙ ජාතිය, ආගම, කුලය, දේශපාලන මතය කුමක් වුණත් හැමදෙනා කෙරෙහි ම මෛත්‍රියෙන්, මුදිතාවෙන්, කරුණාවෙන්, උපේක්ෂාවෙන් බැලිය යුතුයි කියන සතර බ්‍රහ්ම විහරණය. මේ ධජයේ මැද තිබෙන්නේ සියපත නොහොත් නෙළුම් මල. එයින් මූර්තිමත් කරන්නෙ සංවරය, හික්මීම. සංවරයක් නොමැතිව සහෝදර සහෝදරියනි, දියුණුවක් ඇති කරගන්න අමාරුයි. මේ ධජය වටා දකින වී කරල් සමෘද්ධිය සංකේතවත් කරනව. **මා ජනවරම ලැබුවේ සාමය, සංවරය, සමෘද්ධිය උදාකරන්න.**

සහෝදර සහෝදරියනි, අද මේ යොවුන් පුරයේ තමුන්නාන්සේලා ලංකාවේ සතර දිග් භාගයෙන් මෙහාට පැමිණුන යොවුන් පරපුර, හැම දිසාවකින්ම හැම පළාතකින්ම උතුරෙන්, නැගෙනහිරින්, බටහිරින්, වයඹින්, උතුරු මැදින්, සබරගමුවෙන්, ඌවෙන්, දකුණෙන් අද නියෝජිතයින් හැටියට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, කියන හැම ජාතියකටම අයිති තරුණ තරුණියන් අද මේ යොවුන් පුරයේ එක් රැස් උනා. දවස් පහක් තමුන්නාන්සේලා මේ යොවුන් පුරයේ ඉඳගෙන අපේ රටේ සාමය, සංවරය, සමෘද්ධිය, ඇති කරන ආකාර ගැන සාකච්ඡා කළා. ලංකාවේ ජනගහණයෙන් භාගයක්ම දුගී දුප්පත් කමින් තැළිල මිරිකිල ඉන්න හැටි තමුන්නාන්සේලා අවධානයට යොමු කළා. මම ඉදිරිපත් කළ දුගී දුප්පත්කම තුරන් කිරීමේ 'ජනසවිය' තමුන්නාන්සේලා විභාගයට පත් කළා. ආහාර මුද්දර වලින් යැපෙන හැම දරු පවුලකටම මාසෙකට රුපියල් දෙදහස් පන්සියක් දීලා ඉන් එක කොටසකින් ඔවුන්ගේ පෝෂණයත් අනිත් කොටස ඉතිරි කිරීමකටත් යවලා මාස විසිහතරක් ඇතුළත ඔවුන් මේ රටේ සංවර්ධනයට නිෂ්පාදනයට යොමු කරල දුගී දුප්පත් කම පිටු දැකීමේ වැඩ පිළිවෙළට තමුන්නාන්සේලාගේ යොවුන් දැන් යොදන ආකාරය තමුන්නාන්සේලා

> **මා**
> **ජනවරම ලැබුවේ**
> **සාමය,**
> **සංවරය සමෘද්ධිය**
> **උදා කරන්න.**

“මේ රටේ සියළුම ජන කොටස් දෙස රජය හා රජයේ නිලධාරීන් බලපු ආකල්පය වෙනස් කරන්නට අධිෂ්ඨාන කරගෙන සිටිනවා.”

තීරණය කළා. ඒ හැම දරු පවුලකටම තරුණ තරුණියන් සිටින බව තමුන්නාන්සේලා දන්නවා. අද රැකීරක්ෂා නැති සංඛ්‍යාව දෙලොස් ලක්ෂයක් වෙනවා. එයින් අට ලක්ෂයක්ම තරුණ, තරුණියන්.

ඒ රැකීරක්ෂා හිඟය මගේ පාලන කාලය තුළ දී මම වෙනස් කරන බව තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්නට කැමතියි. ඒ ක්‍රියාදාමයේ විශාල වගකීම මම තරුණ සේවා සභාවට පවරා ඉවරයි. පාසලකින් ඉවත් වෙන විශ්වවිද්‍යාලයකින් ඉවත් වෙන තරුණයෙක් හෝ තරුණියක් හෝ හය මාසයක් ඇතුළත තමන්ගේ දිවි පෙවෙත ස්වෝත්සාහයෙන් ගෙන යන්නට පුළුවන් වන ආකාරයට ඔවුන් හුරු පුරුදු කිරීමේ වැඩපිළිවෙළ මම තරුණ සේවා සභාවට පවරා දී තිබෙන බව මම ප්‍රකාශ කරන්නට කැමතියි. ඒ තරුණ තරුණියන් සමාජ ක්‍රියාදාමයට කිසිම භේදයකින් තොරව හවුල් කර ගැනීමට මම දැනටමත් උපදෙස් දී තිබෙන බව මම තමුන්නාන්සේලාට මතක් කරන්නට කැමතියි. ඒ සඳහා භාණ්ඩාගාරයෙන් අයවැය වාර්තාවෙන් උවමනා කරන සම්පත් මම තරුණ සේවා සභාවට ලබා දෙන බව, ලබා දී තිබෙන බව මම තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්න කැමතියි. තරුණ සේවා සභාව ප්‍රථමයෙන්ම ආරම්භ කළේ 1965-70 ත් අතර ශ්‍රීමත් ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ පාලන කාලය තුළ අපේ හිටපු ජනාධිපති ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා බව තමුන්නාන්සේලා දන්නවා. ඒ වැඩපිළිවෙළට නියම ජීවයක් ලැබුණේ 1977න් පස්සේ. ඒ ජීවය දීමට මූලික වුණ තරුණ ඇමතිවරයා තමයි. වර්තමාන කර්මාන්ත ඇමති රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ඒ වැඩපිළිවෙළ ඉතා බුද්ධිමත් ලෙස ඉතා විධිමත් ලෙස ඉතා ශූරවත් ලෙස ක්‍රියාත්මක කළේ තමුන්නාන්සේලාගේ නායක තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් තරුණ සේවා සභාවේ සභාපති වරින රත්වත්තේ මහතා බව තමුන්නාන්සේලා දන්නවා. වරින රත්වත්තේ මහතා මෙවර මැතිවරණයට ඉදිරිපත්

වෙයි කියල මම බලාපොරොත්තු වුණා. මම කියල තිබුණා පුළුවන් නම් එතුමා පොළඹවන්න යි කියල ජාතික ලැයිස්තුවට ඇතුළත් කරන්න. එතුමා බොහොම නිහතමානී කෙනෙක්. එතුමා ඒ නිහතමානීකම නිසාම වෙන්න ඕන ඒ ඉල්ලීම පිළිගත්තෙ නැත්තෙ. එහෙම ඉදිරිපත් වුණා නම් එතුමා අද මේ රජයේ කැබිනට් ඇමතිවරයෙක් බව මම තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්න කැමතියි. කොයි එක වුණත් එතුමාගේ සේවාව තමුන්නාන්සේලාට ඉදිරියටත් ලබාදී තිබෙනවා. තමුන්නාන්සේලාට අද තවත් දක්ෂ ඇමතිවරයෙක් ලැබිල තිබෙනව, අප හිතවත් නන්ද මැතිව් මහතා. තමුන්නාන්සේලාට හිටිය තවත් උද්‍යෝගිමත් නියෝජ්‍ය ඇමතිවරයෙක් ගාමිණී අතුකෝරල මහතා. අද එතුමා මහවැලි කටයුතු භාර අරන් තිබෙනවා. තමුන්නාන්සේලාට අද තවත් බුද්ධිමත් රාජ්‍ය ඇමතිවරයෙක් ලැබිල තිබෙනවා, චන්ද්‍රා ගන්කන්ද මහතා. මට කිසිම සැකයක් නැහැ මේ ජනසවියට යොවුන් දූත් එක් කිරීමෙන් නැති බැරි ජනතාව පමණක් නොව මේ රටේ හැදී වැඩිගෙන එන තරුණ පරපුරට කාටවුවත් ගැති නැති අදීන ජීවිතයක් සරුසාර ජීවිතයක් ලබන්නට ඒ හැමදෙනාගේම ශක්තිය උත්සාහය හේතු වෙනව. මං දන්නවා, අද තමුන්නාන්සේලාගේ හිත්වල රැව් පිළිරැව් දිදී තමුන්නාන්සේලා ඉදිරියේ මැවී තිබෙන ප්‍රශ්ණය මොකක්ද කියලා. ජනාධිපතිතුමනි, තමුන්නාන්සේ බලාපොරොත්තුවෙන මේ සමෘද්ධිය ඇති කර ගන්න මේ රටට සාමයක් අවශ්‍ය නේද කියන ප්‍රශ්ණය තමුන්නාන්සේලාගේ හිතේ රැව් පිළිරැව් දෙනව. කලකට පෙර උතුරෙත් නැගෙනහිරත් සාමය නැති වුණා. උතුරටත් නැගෙනහිරටත් අසාධාරණ සිද්ධ වුණාය කියන පදනම මත යි ඒ අර්බුදකාරී තත්ත්වය ඇති වුණේ. උතුරෙත් නැගෙනහිරත් ජනතාවට සාධාරණය ඉෂ්ඨ වන්න නම් ඒ ජනතාවට පාලන තන්ත්‍රයට සහභාගී වන්නට ඉඩකඩ අවශ්‍ය බව ප්‍රකාශ වුණා. ඒ සඳහා තමයි, පළාත් සභා ක්‍රමය ඉදිරිපත් කෙරුණේ.

---

**"ජනසවියට
යොවුන් දූත් එක් කිරීමෙන්
නැති බැරි ජනතාව
පමණක් නොව
මේ රටේ හැදී වැඩිගෙන එන
තරුණ පරපුරට
කාටවත් ගැති
නැති අදීන
ජීවිතයක්
සරුසාර ජීවිතයක් ලබන්නට
ඔබලාගේ ශක්තිය
උත්සාහය
හේතු වෙනවා."**

---

“පාසලකින් විශ්වවිද්‍යාලයකින් ඉවත් වෙන තරුණයෙක් හෝ තරුණියක් හය මාසයක් ඇතුළත තමන්ගේ දිවි පෙවෙත ස්වෝත්සාහයෙන් ගෙන යන්නට පුලුවන් වන ආකාරයට ඔවුන් හුරු පුරුදු කිරීමේ වැඩපිළිවෙළ මා තරුණ සේවා සභාවට පවරා දී තිබෙනවා.”

ඒකීය පාලනයක් හැටියට රටේ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා විය යුතු නිසා, සහෝදර සහෝදරියනි, පළාත් 2කට පමණක් විශේෂ පාලන තන්ත්‍රයක් ඇති කරන්න පුළුවන් කමක් නෑ. එසේ කලොත් එය අපේ සෝවරී ආණ්ඩුක්‍රමයට විරුද්ධයි. ඒ නිසා තමයි, පළාත් සභා ක්‍රමය මුළු රටම වැළඳගන්නා ආකාරයට ක්‍රියාත්මක කරන්න යෙදුනෙ. අද ඡන්දයෙන් පළාත් සභා පත් කරල ක්‍රියාත්මක වීම ආරම්භ වෙලා තිබෙනව. තවම බලතල නිසි අන්දමට විමධ්‍යගත වෙලා නැහැ. මධ්‍යගතවී තිබෙන මේ බලතල කිපාකාරයකින් විමධ්‍යගත කළ යුතුව තිබෙනව. මම පත් වුණ අවස්ථාවේ ඉඳලම ඒ ගැන ක්‍රියාකරගෙන යනව.

තවත් අඩුපාඩුකම් තිබෙනවා. නීති රීති වෙනස් කිරීමෙන්. පරිපාලන ක්‍රම වෙනස් කිරීමෙන්. නිලධාරීන් ඒ ඒ ප්‍රදේශවලට යැවීමෙන් ඒ පාලන බලතල විමධ්‍යගත කළ යුතුව තිබෙනවා. ලබන බ්‍රහස්පතින්දත් මම සියළුම ප්‍රධාන ඇමතිවරුන් සමඟ, කැබිනට් ඇමතිවරුන් සමඟ මේ ගැන සාකච්ඡා කරල නිසි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. පළාත් සභා ක්‍රමය අත්හද බැලීමක්. අප මෙය ක්‍රියාත්මක කිරීමෙන් බලන්නට ඕන අපේ ජනතාවගේ අසහනය, පාලන තන්ත්‍රයට හවුල්වීමට ඇති බාධාවල් එය මගින් නැතිවෙනව ද කියල. මේ වැඩපිළිවෙල ක්‍රමවත් කළ හැක්කේ කෙසේ ද? මෙහි අඩුපාඩුකම් මොනවා ද කියන එක අපි නැවත සමාලෝචනය කළ යුතුව තිබෙනවා. පළාත් සභා ක්‍රමය මගින් පාලන බලතල ගමට ම විමධ්‍යගත කළ යුතුව තිබෙනවා. රටේ හැම ප්‍රදේශයකම හැම නියම් ගමකම ජීවත්වන හැම කෙනෙකුටම හැඟීමක් ඇතිවෙන්න ඕන මම පත් කළ පාලනය මගේ දෙපතුළ ළඟට ඇවිල්ලයි කියන එක. රටේ හැම තරුණ තරුණියකටම හැඟීමක් ඇති වෙන්න ඕන මගේ දක්ෂ පක්ෂකම් අනුව මේ රටේ ඉහළම පාලන තන්ත්‍රයට ගමන් කරන්න මට අවකාශ ලැබෙනවයි කියල.

ඒ නිසා සහෝදර සහෝදරියනි, මේ අත්හද බැලීම් අප නිරතුරුවම කළ යුතුයි. අපේ ජනතාව ගේ අසහනය නැති කරන්න. අපි කටයුතු කරන්න ඕන ජනතාව අතර අසහනයක් ඇති වී තිබෙනවා නම් ඒ අසහනය ඇතිවීමට හේතු මොනවා ද කියල සොයා බලා ඒ හේතු ඉවත් කරන්න. උතුරේ නැගෙනහිර පමණක් නොවෙයි, අද ලංකාවේ අනිත් පළාත්වලත් අර්බුදකාරී තත්ත්වයක් ඇති වී තිබෙනවා. සාමය බිඳීගොස් තිබෙනවා. අසහනය ඇති වී තිබෙනව. හිංසාව පැතිරී තිබෙනවා. අපි හොයන්නට ඕන මේවට ඇති හේතු මොනවා ද කියල. ඒ හේතු ඉවත් කරන්න අපි ක්‍රියා කරන්න ඕන. මම ජනසවිය දුගී දුප්පත්කම නැති කිරීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්නෙත් එක් හේතුවකට, ආර්ථික අගේතියට පිළිතුරක් හැටියට යි. ආර්ථික අගේතිය පමණක් නොවෙයි. දේශපාලන අසහනය තිබෙන්නටත් පුළුවන්. සමාජ අසාධාරණකම් තිබෙන්නටත් පුළුවන්. ඒවා හේතුවෙලා ඇති සමහර කොටස්වලට ජනසම්මතවාදී ක්‍රියාමාර්ගයෙන් බැහැර ව වෙනත් මාර්ගවලට ප්‍රවිෂ්ට වෙන්නට. මම ලැස්තියි තමුන්නාන්සේලා පත් කළ ජනාධිපතිවරයා හැටියට, මගේ ආණ්ඩුව ලැස්තියි, තමුන්නාන්සේලා පත් කළ නියෝජිතයින් හැටියට, දේශපාලන වශයෙන් අසහනයක් තිබෙනව නම්, සමාජ අසාධාරණකම් නිසා අසහනයක් තිබෙනවා නම්, ආර්ථික වෙනස්කම් නිසා අසාධාරණයක් තිබෙනවා නම් ඒ හේතු මොනවාද කියා දැනකියාගෙන ඒවාට පිළියම් යොදන්නට. සාමය නැතිවෙලා තිබෙනවා නම්, දේශපාලන හේතු නිසා, ආර්ථික හේතු නිසා, සමාජ අසාධාරණකම් නිසා එහෙනම් ඒ මොනවාද කියා සොයා බලා සාමය ඇති කිරීමට පිළිවෙළක් මම මගේ මැතිවරණ ප්‍රකාශණයෙන් ඉදිරිපත් කරල තිබෙනවා. මෙන්න මගේ මැතිවරණ ප්‍රකාශණය.

අපේ මාතෘ භූමියට නව දර්ශණයක්, නව පිළිවෙතක්, සාමය ඇති කරන්න බලාපොරොත්තු වෙන්නෙ කොහොම ද ? හැමදෙනාගේ ම අදහස් උදහස් විමසීමෙන්, ඒ

" පළාත් දෙකකට පමණක් විශේෂ පාලන තන්ත්‍රයක් ඇති කරන්න පුළුවන්කමක් නෑ. එසේකළොත් එය අපේ සෙවරි ආණ්ඩු ක්‍රමයට විරුද්ධයි. "

අදහස් උදහස්වලට ගරු කිරීමෙන්, හැමදෙනාගේ අදහස් උදහස් අනුව එකඟ වී ක්‍රියා කිරීමට වැඩපිළිවෙළක්. යෙදීමෙන් අපි සාමය උදා කරන්නට බලාපොරොත්තු වෙනවා.

සාමය යුද්ධමය ක්‍රියාදාමයකින් උදාකරන්න පුළුවන් කියල අපි විශ්වාස කරන්නෙ නෑ. මිලිටරි ක්‍රියා මාර්ගයකින් සාමය උදා කරන්න පුළුවන් කියල මම කවදාවත් පිළිඅරන් නෑ. ඒවගේම කවදාවත් අසහනයට පිළියමක්, විමුක්තියක් පෞද්ගලික හා පොදු දේපල විනාශ කිරීමෙන්, මිනිසුන් මරා දැමීමෙන්, කඩාකප්පල් ක්‍රියාවලින් ලබන්නට බැරි බව අප පිළිගත යුතුයි. සහෝදර සහෝදරියනි, යම් පාලනයක් යුද්ධමය ක්‍රියාදාමයකින් පොදු ප්‍රශ්ණ විසඳන්නට ක්‍රියා කළොත් ඒ පාලනය ඒ රජය තමන් ක්‍රියාත්මක කරන යුද්ධමය ක්‍රියාකලාපය මඟින් ම විනාශ වී යනවාට කිසිම සැකයක් නැහැ. ඒ වාගේමයි සහෝදර සහෝදරියනි, යම් ව්‍යාපාරයක් හිංසාකාරී ක්‍රියා මාර්ගයකින් විමුක්තිය ලබා ගන්නට ක්‍රියා කළොත් ඒ ව්‍යාපාරයේ හිංසාකාරී ක්‍රියාදාමය විසින් ම ඒ ව්‍යාපාරය විනාශ කරන බව එවැනි ව්‍යාපාරවලටත් අත් වූ ඉරණම්වලින් අපි ඉගෙන ගෙන තිබෙනවා.

එහෙනම් සහෝදර සහෝදරියනි, මේ ක්‍රියා මාර්ග දෙකම අපි ප්‍රතික්ෂේප කරනව නම් අපට විවෘතව තිබෙන්නෙ එකම එක ක්‍රියා මාර්ගයක් පමණයි. ඒ එකම එක ක්‍රියා මාර්ගය නම් අපි සාකච්ඡාවෙන්, සම්මන්ත්‍රණයෙන් අදහස් උදහස් හුවමාරු කර ගැනීමෙන් ප්‍රශ්නවලට විසඳුම් සොයා ගැනීමයි. ඒ නිසයි මම ආරාධනා කරන්නෙ යම් කොටසක්, තමන්ට අසාධාරණයක් වුණා යයි කියල, අසහනයක් වුණා යැයි කියල ජනසම්මතවාදී ක්‍රියා මාර්ගයෙන් බැහැරව වෙනස් සටන්කාමී ක්‍රියා මාර්ගයක් අනුගමනය කරනව නම්, මම ඒ හැම කොටසකටම ආරාධනය කරනවා මා සමඟ මේ ගැන සාකච්ඡා කරන්න, මගේ රජය සූදානම් නමුත්නාන්සේලා ව පිළිගන්න. අපි

> “රටේ හැම ප්‍රදේශයකම ජීවත්වන හැම කෙනෙකුටම හැඟීමක් ඇතිවෙන්න ඕන මම පත් කළ පාලනය මගේ දෙපතුළ ළඟට ඇවිල්ලයි කියන එක.”

අතීතය අමතක කරමු. අද උතුරෙත් නැගෙනහිරත් සටන්කාමීව අවි ආයුධ අතට අරගෙන යම් යම් වැඩපිළිවෙළ වැ ් ගෙනිච්ච කොටස් ගණනාවක් අද ඒවා අත්හැරල දල ජනසම්මතවාදි ක්‍රියාදාමයට ඵලඹී තිබෙන බව තමුන්නාන්සේලා දන්නව. එක කණ්ඩායමක් ඇරෙන්න. ඇල්. ටී. ටී. ඊ. කණ්ඩායම ඇරෙන්න. අනිත් කණ්ඩායම් අද උතුරෙත් නැගෙනහිරත් ජනසම්මතවාදි ක්‍රියාදාමයට ඇවිත් පළාත් සභාවලට පත් වෙලා. පාර්ලිමේන්තු තරඟවලට ඉදිරිපත් වෙලා. සාකච්ඡාවෙන්. සම්මන්ත්‍රණයෙන් ඒ ප්‍රශ්ණ විසඳගන්න ඉදිරිපත්වී සිටින බව අද තමුන්නාන්සේලා දන්නවා.

මම ඇල්. ටී. ටී. ඊ. කණ්ඩායමටත් ඒ නිසා ආරාධනය කලා. කරුණාකරල අපි සාකච්ඡාවෙන්. සම්මන්ත්‍රණයෙන් අපි අපේ ප්‍රශ්න විසඳ ගනිමු කියල.

අපි අපේ වාද භේද උග්‍ර කර ගන්න නිසා නේද අපි අපි ගැනම අවිශ්වාසයක් ඇති කර ගන්න නිසා නේද ඉන්දියාවෙන් සාම හමුදාවක් අපේ රටට ආවෙ ? . . . එද සාම හමුදාවට මල් මාලා දලා. ගරු කරල පිළිගත්ත අය පවා අද උතුරෙත් නැගෙනහිරත් කියන්නෙ. ඉන්දියානු සාම හමුදාව යා යුතු යි කියල නේද ? අපි සහෝදර සහෝදරියනි. සහෝදරත්වයෙන්. සාකච්ඡාවෙන්. සම්මන්ත්‍රණයෙන්. සම්මුතියෙන් අපේ ප්‍රශ්න විසඳගන්න ඉදිරිපත් වුණොත් අපට බාහිර ආරක්ෂාවල් අවශ්‍ය නැති බව තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති.

පළාත් සභා ක්‍රමයේ අඩුපාඩුකම්. දුර්වලකම් තිබෙනව නම්. අපි සමාලෝචනය කරමු. ඒවා ගැන නැවත විමසා බලමු. අද ජනතා විමුක්ති පෙරමුණ ලංකාවේ පිළිගත්ත දේශපාලන පක්ෂයක්.

සටන්කාමී ක්‍රියාමාර්ගයට
යොමු වන්නට
යම් දේශපාලනමය
සාමාජිකමය, ආර්ථිකමය
හේතුවක් තිබෙනවා නම්
ඒවා ඉවත් කරන්නටත්
අපි
සාකච්ඡා කරමු.

“සාමය
යුද්ධමය ක්‍රියා
දමයකින් උදකරන්න
පුළුවන් කියල
අප විශ්වාස කරන්නෙ
නෑ.”

1983 දී ඇති වෙච්ච කලබලකාරී තත්ත්වය නිසා ලංකාවේ දේශපාලන පක්ෂ කීපයක්ම තහනම් කළ බව තමුන්නාන්සේලා දන්නව. ජනතා විමුක්ති පෙරමුණත් ඒ අවස්ථාවේ තහනම් කරන්නට යෙදුණ. තහනමට ලක්වෙච්ච අනිත් දේශපාලන පක්ෂවලත් තහනම ඉවත් කෙරුණ. ජනතා විමුක්ති පෙරමුණේ තහනම ඉවත් කෙරුණේ නෑ. ජනතා විමුක්ති පෙරමුණේ තහනම අසාධාරණ එකක් බව එදත් මම කිව්වා, අදත් මම ප්‍රකාශ කරන බව තමුන්නාන්සේලා ඉදිරියේ මම කියා සිටිනවා. ජනතා විමුක්ති පෙරමුණේ තහනම පසුව ඉවත් කරන්නට යෙදුනා. නමුත් ජනතා විමුක්ති පෙරමුණ සමාජය ඉදිරියට ආවෙ නෑ. සැකය නිසා. මේ තහනම ඉවත් කළේ අපි අල්ල ගන්න යි කියල සැකයක් ඇති උනා නම්, මං ඒ ගැනත් පුදුම වෙන්නෙ නෑ. ඒ නිසා ඇතැම් කොටස්වලට ජන සම්මත ක්‍රියා මාර්ගයෙන් බැහැරව සටන්කාරී ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන්න සිදුවුණා නම් ඒකට මම පුදුම වෙන්නේ නෑ. එහෙනම් මම දැන් කියන්නෙ, කරුණාකරල, මගේ අදහස් උදහස් තමුන්නාන්සේලා දන්නව, මම එකක් කියලා වෙන එකක් කරන පුද්ගලයෙක් නොවන බවත් තමුන්නාන්සේලා දන්නව. මේ යන වැඩපිළිවෙළින් කාටවත් සුවසෙතක් ඇතිවෙන්නෙ නැති බවත් තමුන්නාන්සේලා දන්නව. මේ හිංසාකාරී ක්‍රියාදාමයෙන් මිනිසුන් මැරීමෙන් වැඩකටයුතු කඩාකප්පල් කිරීමෙන් අද පාඩුවක් අසාධාරණයක් දුකක් සිද්ධවෙන්නේ කාට ද, අපේ අහිංසක ගම්වැසියන්ට, නගරවැසියන්ට, දුගී දුප්පත් ජනතාවට, මේ හැදී වැඩීගෙන එන තරුණ පරපුරට බව තමුන්නාන්සේලා දන්නව. ඒ නිසා මම ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයට ආරාධනා කරනව. කරුණාකරල අපි සාකච්ඡාවට එළඹෙමු. සම්මන්ත්‍රණයට එළඹෙමු. අපේ අදහස් උදහස් හුවමාරු කර ගනිමු. අපේ දේශපාලන ආර්ථික හා සමාජ ප්‍රශ්නවලට විසඳුම් හොයමු. ඒ නිසා ඒ වැඩපිළිවෙළට අවතීර්ණ වන හැටියට මම ආරාධනා කරනව.

ඒ සටත්කාමී ක්‍රියා මාර්ගයට අවතීර්ණව යම් තරුණයෙක් තරුණියක් සිටිනව නම්, තමුන්නාන්සේලා කොහේ හිටියත් කමක් නෑ, කරුණාකරලා දන්වත්, ඒ ගමන් මාර්ගය අත්හරින්න. අපත් සමඟ එකතුවන්න. මම කියන්නෙ නෑ ආයුධ බිම තියල එන්න යි කියල . . . මම කියන්නෙ නෑ ආයුධ අරන් එන්න යි කියල. මට ඒ ක්‍රම ගැන විශ්වාසයක් නෑ. කොයි මිනිහද ආයුධයක් තියෙන කෙනෙක් ඒවා උස්සාගෙන එන්නෙ. ආයුධ කීපයක් තියෙන කෙනෙක් කොහොමටත් ආයුධ කීපයක් තියල තමයි එන්නෙ. හංගලයි එන්නෙ. ඒ යථාර්ථය අපි දන්නව. මට ආයුධවලින් ප්‍රශ්ණයක් නෑ. මම ආයුධ ගැන විශ්වාසයක් තියෙන කෙනෙක් නෙවෙයි. මම මනුෂ්‍යත්වය ගැන විශ්වාසය තියන කෙනෙක්. මම හැමදෙනාම විශ්වාස කරන්න සූදානම් කෙනෙක්. මාව විශ්වාස කරන්න. මගේ පාලනය විශ්වාස කරන්න. කරුණාකරලා, ඉක්මණට අපිත් එක්ක එකතු වෙන්න. එසේ එන්නට පුළුවන් වන අයට, එසේ පැමිණ අපේ ජනසම්මතවාදී ක්‍රියාමාර්ගයට එකතුවෙන්න මම විධිවිධාන යොදනවා. මම කිසිම කෙනෙකුට අයුක්තියක් අසාධාරණයක් වෙන්නට ඉඩතියන්නෙ නෑ. ඒ සියළුදෙනාම පිළිගන්නව ඒ සියළුදෙනාගේම අදහස් උදහස් අනුව ඔවුන්ට අනාගත සුභ සෙතක් ඇති කරන්න මම විධි විධාන යොදනවා. පසුගිය කාලෙ වෙච්ච දේවල් අපි අමතක කරනවා. නව යුගයක් උදා කරන්නට අපි ක්‍රියා කරනවා. එසේ පැමිණෙන උදවිය සාධාරණයෙන් පිළිගන්නවා පමණක් නොවෙයි, ඒ උදවියට සම්පූර්ණ සමාවක් දෙනවා පමණක් නොවෙයි, ඒ උදවිය ගේ ඥාති මිත්‍රාදීන් පවා ආරක්ෂා කරන බව මම ප්‍රකාශ කරන්නට කැමතියි.

උතුරෙත් නැගෙනහිරත් ඒ විදියට ජනසම්මතවාදී ක්‍රියාදමයට ඇතුල් වුණ කොටස්වලට මේ විදිහට සලකල තිබෙනවා. ඔවුනට සමාව දීල තිබෙනවා. ඒ සාධාරණයම අතීත් හැම දෙනාටමත් අපි ඉටු කරනවා. මෙහෙම මේ ජනසම්මතවාදී ක්‍රියාදමයට එකතු වුණාම මම බලාපොරොත්තු වෙනව දඩුවම් ලද අයගේ දඩුවම් වෙනස් කරන්නට සහෝදර සහෝදරියනි.

"පෞද්ගලික හා පොදු දේපළ
විනාශ කිරීමෙන්,
මිනිසුන් මරා දැමීමෙන්,
කඩාකප්පල් ක්‍රියාවලින්
විමුක්තියක්
ලබන්නට බැරි බව
අප පිළිගත
යුතුයි."

"අප අපේ වාද භේද
උග්‍ර කර
ගත්ත නිසා නේද
අප අප ගැනම
අවිශ්වාසයක් ඇති කර
ගත්ත නිසා නේද
ඉන්දියාවෙන් සාම හමුදවක්
අපේ රටට ආවෙ? . . ."

එතකොට දේශපාලන සිරකරුවන් කියල කණ්ඩායමක් ඇති වෙන්නෙ නෑ. මම නේද, අවුරුදු 5කට වැඩි කාලයක් තිබුණු හදිසි නීතිය සම්පූර්ණයෙන් ඉවත් කළේ පත් උනාට පසුව. උසාවියකට ඉදිරිපත් කරල චෝදනා අනුව තඩුවක් පවරන්නට බැරිව සිටි හැම සිරකරුවෙක්ම නිදහස් කලා නේද සහෝදර සහෝදරියනි.

දහස් ගණනක් මේ දේශපාලන සිරකරුවන් මම නිදහස් කළ බව තමුන්නාන්සේලා දන්නවා. ඒ විතරක් නොවෙයි, මම කියන්නට කැමතියි ඉල්ලීමක් තිබෙනවා නම් පී. ටී. ඒ. කියන නීතිය එනම් ත්‍රස්තවාදය මර්ධනය කිරීමේ නීතියත් අහෝසි කරන්නටයි කියලා. මම ලෑස්තියි එවැනි ක්‍රියාමාර්ගයක් උනත් ගන්නට. තමුන්නාන්සේලා සාමකාමී ක්‍රියා පිළිවෙළට ඉදිරිපත් වෙලා සටන්කාමී ක්‍රියාමාර්ගයෙන් බැහැරව ජනසම්මතවාදී ක්‍රියාමාර්ගයට එනව නම්, තමුන්නාන්සේලා කල්පනා කරනව නම් යම් නීතියත් අසාධාරණයි කියල, අද පාර්ලිමේන්තුවක් තිබෙනවා, හැම දේශපාලන මතයක්ම නියෝජනය වන ඒ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරල සාධාරණය ඉෂ්ට කරන්නට මම බලාපොරොත්තු වන බව අවධාරණයෙන් ප්‍රකාශ කරන්නට කැමතියි. සමහරවිට මට දකින්නට ලැබෙනවා පත්‍රිකාවක්. අපි සටන්කාමී ක්‍රියාමාර්ගය අනුගමනය කරන්නෙ මෙන්න මේ කාරණා නිසයි කියලා.

අන්න ඒ කරුණුවලට තමයි, මම මේ පිළිතුරු දීගෙන යන්නෙ. එකතැනක සඳහන්වෙලා තිබෙනවා, 1983 තිබුණු තැනට ආරක්ෂක සංවිධාන ආපහු ගෙනයන්නට කියලා. මම ලෑස්තියි ඒ ඉල්ලීම පිළිගන්නට. මම ලෑස්තියි 1983 තිබුණු තත්ත්වයට ආරක්ෂක සංවිධාන ගෙනියන්න. 1983 ඇතිවෙච්ච අර්බුදකාරී තත්ත්වයට කලින් ආරක්ෂක සංවිධාන තිබුණු තැනට ගෙනියන්න මම ලෑස්තියි. එහෙනම් 1983 අර්බුදකාරී තත්ත්වයට කලින් තිබුණ සාමකාමී තත්ත්වයක් ඇති කරන්න අපි සැම දෙනාම ක්‍රියා කරමු.

1983 අර්බුදකාරී තත්ත්වයට කලින් තිබුණු තත්ත්වයට රටේ සාමය ඇතිවන විට මම පොරොත්දු වෙනවා ආරක්ෂක සංවිධානත් ඒ තත්ත්වයට ගෙනියන්න.

තව ඉල්ලීමක් තිබෙනවා. රටේ සෙසු පළාත්වල සාමයක් ඇති වෙන්න නම් අයි. පී. කේ. ඇෆ්. ඉන්දියානු සාම හමුදාව පිටමං කරන්නට යි කියලා.

මම ඒකත් පිළිගන්න ලෑස්තියි. ඇයි? ඉන්දියානු සාම හමුදාව අපට තවමත් මේ ප්‍රමාණය රඳවා ගන්න සිද්ධවෙලා තිබෙන්නෙ? මම පොරොත්දු වුණා තමුන්නාන්සේලාට මම පත් උනාම ඉන්දියානු සාම හමුදාව පිටමං කරනව යි කියලා. මම පත්වෙච්ච හැටියෙම කරපු පළවෙනි දේ එයයි. ඉන්දියාව මගේ ඒ ඉල්ලීම පිළිගත්තා. මගේ ඉල්ලීම අනුව සාම හමුදාව ඉවත්කරන්නට ක්‍රියා කළා පමණක් නොවෙයි. දහස් ගණනක් සාම හමුද හටයින් ගෙන ගියා.

තමුන්නාන්සේලා දන්නව උතුරෙත් නැගෙනහිරත් අද තිබෙන තත්ත්වය. සටන්කාමී කණ්ඩායම් ගණනාවක් අද ඒ ගමන් මාර්ගයෙන් ඉවත් වෙලා ජනසම්මතවාදයට ඉදිරිපත් වෙලා ඉන්නවා. තාමත් ඇල්. ටී. ටී. ඊ. කණ්ඩායම ඉදිරිපත් වෙලා නෑ. එහෙ ආරක්ෂක සංවිධාන තර කළ යුතුව තිබෙනවා. උතුරෙත් නැගෙනහිරත් ආරක්ෂක සංවිධාන තර කරන්න නම් සෙසු පළාත්වල ඉන්න ශ්‍රී ලංකාවේ පොලීසියත් ආරක්ෂක අංශයත් ඒ ප්‍රදේශවලට යැවිය යුතුව තිබෙනවා. සහෝදර සහෝදරියනි.

ලංකාවේ සෙසු පළාත්වල ගෙවල් ගිණි තියනව නම්. විදුලිබලාගාර විනාශ කරනව නම්. බිම් බෝම්බ දනවා නම් ජනතාව මරා දමනව නම්. පොලීසියත් ආරක්ෂක හමුදාවත් උතුරටත් නැගෙනහිරටත් යවන්නෙ කොහොමද කියල මම තමුන්නාන්සේලාගෙන් අහනවා.

---

“ජනතා විමුක්ති පෙරමුණේ තහනම අසාධාරණ එකක් බව එදත් මා කිව්වා. අදත් මා ප්‍රකාශ කරනවා.”

---

‘හිංසාකාරී ක්‍රියාදාමයෙන් මිනිසුන් මැරීමෙන් වැඩ කටයුතු කඩාකප්පල් කිරීමෙන් අද පාඩුවක් අසාධාරණයක් දුකක් සිද්ධ වෙන්නේ අපේම අහිංසක ජනතාවට.’

යම් යම් පළාත්වල සිද්ධි ඇති වුණාම ජනතාව විවේචනය කරනව. කෝ පොලීසිය, කෝ ආරක්ෂක සංවිධාන කියලා. පොලීසියෙ ඉන්නෙ කවුද? ආරක්ෂක සංවිධානවල ඉන්නෙ කවුද? අපේම සහෝදර සහෝදරියන් නේද? ඔවුන් අද සිය ගණනක්, දහස් ගණනක් ජීවිත පූජා කර තිබෙනවා නේද? පොලීසියෙත් හමුදාවල්වලත් අද කොයි තරම් ගටයින් මැරිල තිබෙනව ද. ඒ නිසා කොයි තරම් දරු පවුල් අනාථ වෙලා තිබෙනව ද? රජයේ සේවකයින් කොයි තරම් ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනව ද. එක්සත් ජාතික පක්ෂයේ පමණක් දහස් ගණනක් ජීවිත පූජා කරල තිබෙනවා. අනිත් දේශපාලන පක්ෂවලත් හිතවතුන් පාක්ෂිකයින් මරාදමා තිබෙනවා. එතකොට සහෝදර සහෝදරියනි, කොහොමද, පොලිස් ගටයින් ආරක්ෂක හමුදාව උතුරටත් නැගෙනහිරටත් යවන්නෙ. ඒ නිසා නේද? ඉන්දියානු සාම හමුදාව පිට කිරීම ප්‍රමාද වී තිබෙන්නෙ. ඉන්දියාවත් බොහොම ඕනෑකමින් කියනව ඒ සාම හමුදාව ඉවත් කර ගැනීමට තමුන්ට ඕනෑ යි කියලා. මම ඒ ගැන ස්තුතිවන්ත වෙනව ඉන්දියාවට, ඉන්දියාවෙ අගමැතිතුමාට. අපට දැනුම් දීල තිබෙනවා කියන ඕනෑම වෙලාවක මේ හමුදාව ඉවත් කර ගන්නට සූදානම් බව. ඉන්දියානු හමුදාවෙන් උදවිය ජීවිත පූජා කරල තිබෙනවා. එහෙනම් ඉන්දියානු සාම හමුදාව ඉවත් කිරීම කඩිනම් කරන්න රටේ අනිත් පළාත්වල සාමකාමී තත්ත්වයක් ඇති කරන මෙන් මම කරුණාවෙන් ඉල්ලා සිටිනව.

සටන්කාමී ක්‍රියාමාර්ගයක් ගෙන යන්න තවත් හේතුවක් හැටියට කියන්නෙ මොකක් ද? ඉන්දු-ලංකා ගිවිසුම අවලංගු කරන්නට ලු. දැන් අවලංගු කරන්නට කිසි දෙයක් ඉතුරු වෙලා නෑ. ඒ ගිවිසුමේ වැඩකටයුතු ඉවරයි. ඉල්ලීමක් තිබෙනවා, ඉන්දියාවත් සමඟ මිත්‍ර ගිවිසුමක් ඇති කර ගන්න කියල. මම තමයි ප්‍රථමවරට ඒ අදහස ඉදිරිපත් කළේ. සෝවියට් දේශයත් ඉන්දියාවත් ඇති කර ගත්ත මිත්‍ර ගිවිසුමක් තිබෙනවා. ඒ දෙරටේ ම ඕනෑ එපාකම් ඉටුකරගැනීමේ මිත්‍ර ගිවිසුමක්. ඒ ගිවිසුම අනුව එක රටක් යමක් කරනව නම් ඊට ප්‍රතිචාරයක් අනික් රට දක්වන්න ඕන. ඒකට ඉංග්‍රීසියෙන් කියන්නෙ, රෙසි ප්‍රොසිටි. රෙසිප්‍රෝකල් ගිවිසුමක් ඒක.

මම යි ප්‍රථමයෙන් ම ඒ අදහස ඉදිරිපත් කළේ. එවැනි ගිවිසුමක් ඇතිකරගන්න දැන් අප දෙ රටම ක්‍රියාකරගෙන යන බව මම ප්‍රකාශ කරන්න කැමතියි.

මම සඳහන් කළේ සහෝදර සහෝදරියනි. සටන්කාමී ක්‍රියාමාර්ගයක් ගෙන යන්නෙ මේවා සඳහා ය කියල. මම දැන් ප්‍රතිචාරයක් දක්වල තිබෙනවා. මේ වැඩපිළිවෙලවල් සම්බන්ධයෙන්.යම් යම් පත්‍රිකාවල සඳහන් කරුණු. අපි වැඩිකල් යන්නට ඉස්සරවෙලා ඇති කරනවා මධ්‍යස්ථාන ගණනාවක් ඒවා පිළිගැනීමේ මධ්‍යස්ථාන හැටියට යි ඇති කරන්න බලාපොරොත්තු වන්නෙ. ඒ ස්ථානවලට ඇවිත් අපත් සමඟ එකතු වන හැටියට සටන්කාමී ක්‍රියාමාර්ගයේ ඉන්න හැම දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

රජයේ තියෙන නීත්‍යානුකූල හමුදා ඒකක හැරෙන්නට පොලිසිය හැරෙන්නට නීත්‍යානුකූල ආරක්ෂක සංවිධාන හැරෙන්නට වෙන මොනම සංවිධානයක් වත් ඇති වන්නට මම ඉඩ නොදෙන බව අවධාරණයෙන්ම ප්‍රකාශ කරන්නට කැමතියි.

අපට පුළුවන් සාකච්ඡා පදනමකට ඉදිරිපත් වුණාම. මේවා ගැන විස්තර කතා කරන්න. නව ඉල්ලීමක් තිබුණා. දේශපාලන පක්ෂවලට දීල තිබුණ අවිආයුධ ඉවත් කරන්නට යි කියලා. ඒක ඇත්ත. සියළුම දේශපාලන පක්ෂවල දේශපාලනඥයින්ගේ ආරක්ෂාවට අද විධිවිධාන යොදල තිබෙනවා. ඇයි එහෙම කරන්න සිද්ධ වුණේ? ඔවුන්ගේ ජීවිතවලට තර්ජන තිබෙන නිසා. ඒ තර්ජන ඉවත් වුණාම එවැනි ආරක්ෂා සංවිධාන අවශ්‍ය නොවන බව මම ප්‍රකාශ කරන්න කැමතියි.

අද ලියාපදිංචි වී සිටින සියළුම දේශපාලන පක්ෂවල, ඡන්දයෙන් තේරී පත්වී සිටින සියළුම දේශපාලන පක්ෂවල නියෝජිතයින්ට ආරක්ෂා සංවිධාන ඇති කර තිබෙන බව ඇත්ත. ඒවා ඉවත් කරන්නට පුළුවන් ඒ උදවියගේ ජීවිතවලට තිබෙන තර්ජන ඉවත් වෙන කොට.

"මට ආයුධ වලින්
ප්‍රශ්නයක් නෑ.
මා ආයුධ ගැන විශ්වාසයක්
තියෙන කෙනෙක් නොවෙයි.
මා මනුෂ්‍යත්වය ගැන විශ්වාසය
තියෙන කෙනෙක්.
මා හැම දෙනාම
විශ්වාස කරන්න
සූදනම් කෙනෙක්."

මා කිසිම කෙනෙකුට
අයුක්තියක් අසාධාරණයක්
වෙන්නට ඉඩ තියන්නෙ නෑ.
ඒ සියලු දෙනාම පිළිගන්නව.
ඒ සියලු දෙනාගේම
අදහස් උදහස්
අනුව ඔවුන්ට අනාගත
සුභ සෙතක් ඇති කරන්න
මා විධි විධාන යොදනවා,

ලංකාවේ ලියාපදිංචි වෙච්ච සියළු ම දේශපාලන පක්ෂ ජනතා විමුක්ති පෙරමුණ ඇරෙන්නට අද පාර්ලිමේන්තුවේ නියෝජනය වෙනවා. ඇල්. ටී. ටී. ඊ. කණ්ඩායම ලියාපදිංචි වෙච්ච දේශපාලන පක්ෂයක් නෙවෙයි. මගේ හිතේ තිබුණා, ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙන වෙලාවෙ, මම ජනාධිපති හැටියට පත් වුණා නම්, මම එක්වරම ඒ තිබුණු පාර්ලිමේන්තුව විසුරුවා හරින්නෙ නෑ. තුන් මාසයක් වැඩිම වුණොත් ඒ පාර්ලිමේන්තුව තියා ගන්නව. කුමක් සඳහා ද?

එකක්, අයවැය වාර්තාව සම්මත කරගෙන දුගී දුප්පත්කම නැති කිරීමේ වැඩපිළිවෙලට මුදල් වෙන්කර ගන්න.

දෙවෙනි එක, ජනතා විමුක්ති පෙරමුණත් සමග, එවගේම ඇල්. ටී. ටී. ඊ. සංවිධානත් සමග සාකච්ඡා කරල ඔවුන්ටත් මැතිවරණවලට ඉදිරිපත් වෙන්න පුළුවන් අවකාශයක් ඇතිකරල මාස 3ක් ඇතුළත ඒ පාර්ලිමේන්තුව විසුරුවල මන්ත්‍රී තරග පවත්වන්නටයි මගේ හිතේ තිබුණේ. එහෙකොට ජනතා විමුක්ති පෙරමුණත් සමග සාකච්ඡා කරල, ඇල්. ටී. ටී. ඊ. කණ්ඩායමත් සමග සාකච්ඡා කරල ඒ කණ්ඩායම්වල නියෝජිතයින්ටත් තරඟයට එන්න පුළුවන් ක්‍රමයක් ඇති කරලා මහ මැතිවරණය පවත්වන්නටයි මම බලාපොරොත්තු වුණේ.

කොහේද ඒකට ඉඩක් දුන්නේ නෑ. පාර්ලිමේන්තුව විසුරුවා හරින්න කියල ඉල්ලීමක් කෙරුණ. අපේ හිටපු ජනාධිපතිතුමා ඒ අනුව දෙසැම්බර් මාසෙ 20ද පාර්ලිමේන්තුව විසුරුවා හැරියා.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව විසුරුවා හරින කොට ඒ නියෝගයේම සඳහන් කරන්න ඕන, නාම යෝජනා බාරගන්න දිනය, මැතිවරණය පවත්වන දිනය, අළුත් පාර්ලිමේන්තුව රැස් කරන දිනය. ඒ අනුව දෙසැම්බර් 20ද ම

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

මම පත් වන කොටම, අද මධ්‍යම රාත්‍රියේ පාර්ලිමේන්තුව විසුරුවා හැරලා දෙසැ.31 වෙනිදත් ජනවාරි 06 වෙනිදත් අතර නාමයෝජනා පිළිගැනීම නියම වුණා. පෙබ.15ද පාර්ලිමේන්තු මැතිවරණය නියම වුණා. මාර්තු 09ද අළුත් පාර්ලිමේන්තුව රැස් වන්නට ඕනෑ යි කියල ඒ නියෝගයේම සඳහන් වුණා.

ඒනිසා මම පිළිගන්නවා, දේශපාලන කරළියෙන් ඉවත්ව හිටපු කණ්ඩායම්වලට පසුගිය මහ මැතිවරණයට ඉදිරිපත් වන්නට අවකාශයක් තිබුණේ නෑ. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ වැනි, ඇල්ටිටීඊ කණ්ඩායම් වැනි අයට මහ මැතිවරණයට ඉදිරිපත් වෙන්න බැරි වුණ බව මම පිළිගන්නවා. එහෙනම, අපි කල්පනා කරන්න ට ඕන, මේ කණ්ඩායම් යටත්කාමී ක්‍රියාමාර්ගයෙන් ඉවත් වී ජනසම්මතවාදී ක්‍රියාමාර්ගයට එනවා නම්, ඒ කණ්ඩායම්වල අදහස් උදහස් පාර්ලිමේන්තුවේ රැව් පිළිරැව් දෙන්න කළ හැක්කේ මොකක්ද; වහාම කළ හැක්කේ මොකක්ද කියල.

මට පෙනෙන හැටියට දැනට විවෘතව තිබෙන්නේ එකම එක ක්‍රියා මාර්ගය යි. තමුන්නාන්සේලා දන්නවා, මන්ත්‍රී තරගයට යම් පක්ෂයක් ඉදිරිපත් වන විට, ඒ ඒ දිස්ත්‍රික්කවලට අපේක්ෂකයෝ ඉදිරිපත් කරන අතර, ජාතික ලැයිස්තුවටත් අපේක්ෂකයො හැම පක්ෂයක්ම ඉදිරිපත් කළ යුතුයි. එක පක්ෂයකට 29 දෙනෙක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ 29 දෙනාගෙන් යම් පක්ෂයකට ජාතික ලැයිස්තුවෙන් කී දෙනෙක් පත් කරන්න පුළුවන් ද කියන එක තම නියම වෙන්නෙ ඒ පක්ෂය ලබා ගන්නා මුළු ඡන්ද ප්‍රමාණය අනුව යි. ඒ ලැබෙන ඡන්ද ප්‍රමාණය අනුව ඒ ආසන 29 ඒ ඒ පක්ෂවලට බෙදෙනවා. අපේ පක්ෂය ලබා ගන්න ඡන්ද ප්‍රමාණය අනුව ඒ ආසන 29න් 15 ක් ම අපේ පක්ෂයට අයිති උනා. අනිත් 14 අනිකුත් විරුද්ධ පක්ෂවලට බෙදී ගියා. ඇත්ත වශයෙන්ම, අපේ යටත්කාමී කණ්ඩායම තමන්ගෙ අදහස් පාර්ලිමේන්තුවේ මතු කොට පෙන්නන්න යුදනම් නම් ඔවුන්ගේ නියෝජිතයින් කිහිපදෙනෙකුටවත් පාර්ලිමේන්තුවට පත්වන්නට අවකාශ සළස්සන්නට පුළුවන්.

> 83 අර්බුදකාරී තත්ත්වයට කලින් තිබුණු තත්ත්වයට අප රටේ සාමය ඇතිවන විට මා පොරොන්දු වෙනවා ආරක්ෂක සංවිධානත් ඒ තත්ත්වයට ගෙනියන්න.

"ලංකාවේ සෙසු පළාත්වල ප්‍රචණ්ඩකාරී ක්‍රියා ඇති කරනවා නම්, පොලීසියත් ආරක්ෂක හමුදාවත් උතුරටත් නැගෙනහිරටත් යවන්නෙ කොහොම ද?"

මගේ පක්ෂයෙන් පත් වෙලා සිටින 15 දෙනාගෙත් මට පුළුවන් කීපදෙනෙක් ඉවත් කරලා ඒ ස්ථාන දෙන්නට, අනිකුත් පක්ෂවල උදවියටත් පුළුවනි තමන්ගෙ ලැබී ඇති ආසන 14 ත් ආසන කීපයක් මේ සඳහා දෙන්නට. ඒ ක්‍රමයෙන් හරි මේ උදවියගෙ හඬ පාර්ලිමේන්තුවේ ඇහෙ පිළිගෙන දෙන්නට විධි විධාන යොදන්න මම සූදානම් බව මම නමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්නට කැමතියි.

සහෝදර සහෝදරියනි,

මම මේ හැම ක්‍රියාමාර්ගයක්ම ඉදිරිපත් කිළේ මෙ පළවෙලා තිබෙන දෙමළ පත්‍රිකාවලට මම පිළිතුරු දුන්නෙ, මේ රටෙ සාමය උදාකරගන්න තිබෙන නමුන්නාන්සේලාගේ මහා ප්‍රාර්ථනා සාර්ථක කරන්නට බව මම නමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි.

සටන්කාමී ක්‍රියාමාර්ගයට යොමු වන්නට යම් දේශපාලනමය, සාමාජිකමය, ආර්ථිකමය හේතුවක් තිබෙනවා නම් ඒවා ඉවත් කරන්නටත් අපි සාකච්ඡා කරමු.

එකට එකතුව සාකච්ඡාවෙන්, සම්මුතියෙන්, සම්මන්ත්‍රණයෙන් අපි ක්‍රියා කරලා, හිංසාවෙන් තොරව අපේ රටෙ සමෘද්ධිය ඇති කරන්නට ක්‍රියා කරන්නට එකතු වෙන මෙන් මම හැම කණ්ඩායමකටම මෙ අවස්ථාවේ දී ආරාධනය කරනවා.

යම් කෙනෙක් සටන්කාමී ක්‍රියාමාර්ගයෙන් ඉවත් වී ඇතිකරගන්නට යන පිළිගැනීමේ මධ්‍යස්ථානවලට ඇවිත් ජන සම්මතවාදී ක්‍රියාමාර්ගයට ඉදිරිපත් වුණොත් ඒ තැනැත්තා ව පමණක් නොවෙයි, ඔහුගේ ඥාති මිත්‍රාදීනුත් ආරක්ෂා කරන්නට අපි ඇප වෙනවා, කැප වෙනවා, ඔවුන්ගේ අතීතය අපි අමතක කරනවා. ඔහුට සුබ අනාගතයක් උදා කරන්නට හැම දෙයක්ම අපි ක්‍රියාත්මක කරනවා.

එහෙම ඉදිරිපත් වෙන හැම දෙනාගේම ආරක්ෂාව නවත් සහතික කරන්න මම සූදානම්. රජයේ නිලධාරීන් පමණක් නොවෙයි. ස්වේච්ඡා සංවිධානවල නියෝජිතයිනුත් මේ වැඩ පිළිවෙලට ඇතුල් කරන්න ඕනැ. ඒ මධ්‍යස්ථානවලට එවැනි උදවිය ඉදිරිපත් වෙලා හිටියොත්, තවත් විශ්වාසය තහවුරු වෙවි. මම ඊයේ පෙරේද පාර්ලිමේන්තුවේ මගේ කාර්යාලයට ගිහිල්ලා, පාර්ලිමේන්තුවේ ඉන්න සියළුම පක්ෂවල නායකයින් හමු වුණා. මම ඒ සියළුම නායකයන්ට කිව්වා, නමුත්නාන්සේලා සූදානම් නම්, සටන්කාමී ක්‍රියාමාර්ගයෙන් ඉවත් වී ජනසම්මතවාදී ක්‍රියාමාර්ගයට සහභාගිවීමට, එහෙම එන උදවිය පිළිගන්න මධ්‍යස්ථානවලට නමුත්නාන්සේලාගේ පක්ෂවල නියෝජිතයිනුත් පත් කරන්න සියළු පක්ෂවල නායකයින් ප්‍රධාන කමිටුවක් හැටියට හැදෙන්න. මම මගේ හමුදාවල, පොලීසියෙ ප්‍රධාන නිලධාරීන්ගේ සේවාවත් නමුත්නාන්සේලාගේ කමිටුවලට මම ලබා දෙනව. මේ ඉදිරිපත් වෙන උදවිය හරියට ආරක්ෂා කරනවද, ඒ උදවියට සුභ අනාගතයක් ලබා දෙනවද කියල මේ විවිධ දේශපාලන පක්ෂවල නමුත්නාන්සේලාටම හොයා බලන්න මම අවකාශ දෙනව යි කියල මම ප්‍රකාශ කළා.

මම පාවිච්චි කලේ නෑ, පුනරුත්ථාපන කියන වචනය. අස්වර් මන්ත්‍රීතුමා පාවිච්චි කළාට. මම කිව්වෙ සුභ අනාගතයක් ලබා දෙන්න. මධ්‍යස්ථාන වශයෙන් සියළුම පක්ෂ නායකයින්ට පුළුවන් ක්‍රියා කරන්න ඒ වගේම අපි ඇති කරන පිළිගැනීමේ මධ්‍යස්ථාන රටපුරාම ඇති කරනව. ඔනැම කෙනෙකුට ඇවිල්ල, සටන්කාමී ක්‍රියාමාර්ගයෙන් ඉවත් ව ජනසම්මතවාදී ක්‍රියාමාර්ගයට ඇතුල් වෙන්න.

සමහරවිට මධ්‍යස්ථාන 100ක් 200ක් ඇති කරන්න සිද්ධ වෙවි. ඒ හැම මධ්‍යස්ථානයකමත් සියළුම දේශපාලන පක්ෂවල නියෝජිතයින්ට ඒවා ගැන හොයන්නට බලන්නට මම අවකාශ දෙන බව දැනටමත් මම සියළුම දේශපාලන පක්ෂවල නායකයින්ට කියල තිබෙනව.

---

**ඉන්දියානු සාම
හමුදාව ඉවත් කිරීම කඩිනම්
කරන්න නම්
රටේ අතීත් පළාත්වල
සාමකාමී තත්ත්වයක්
ඇති වෙන්න ඕනේ.**

---

ජනාධිපති ලේකම් කාර්යාලය
25 AUG 2023
පුස්තකාලය

"නිත්‍යානුකූල හමුදා ඒකක හා පොලිසිය හැරෙන්නට වෙන මොනම සංවිධානයක්වත් ඇති වන්නට මා ඉඩ දෙන්නේ නෑ."

සහෝදර සහෝදරියනි, මම මේ සාමකාමී ඉල්ලීම කරන්නේ ශ්‍රී ලංකාවේ අතිශය ඓතිහාසික භූමියක සිට යි. ශ්‍රී ලංකාවේ සාමය, සමගිය, සමෘද්ධිය ඇති කිරීමට හේතු භූතවුණු උදාරතර ධර්ම මාර්ගය අපට ලැබුණේ තුන්ලෝකාග්‍ර වූ සම්මා සම්බුදුපියාණන් වහන්සේගෙනු යි. ඒ තුන්ලෝකාග්‍ර වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේ ප්‍රථම වරට ශ්‍රී ලංකාවට වැඩම කළේ මේ මහියංගණ ශුද්ධ භූමියට බව තමුන්නාන්සේලා දන්නවා. මේ පූජනීය පුණ්‍ය භූමියේ ඉඳලා මම මේ කරන්නා වූ ආයාචනය සියළුදෙනාගේම අවධානයට යොමු වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ඒ නිසා සටන්කාමී ක්‍රියාමාර්ගයෙන් බැහැරව ජනසම්මතවාදී ක්‍රියාමාර්ගයට එළැඹෙන හැටියට තැවත වාරයක් මම ආරාධනය කරනවා. මේ ආයාචනය කිරීමට මට අවකාශ ලබා දුන්න භය වැඩි යොවුන් පුරයට මගේ ගෞරවය පිරි නමමින් මගේ කතාව මෙයින් සමාප්ත කරනවා.

අපේ මාතෘ භූමියට තමුන්නාන්සේලා හැම දෙනාටමත් සමගියත් සංවරයත් සමෘද්ධියත් වහාම උදා වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ප්‍රකාශනය : ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

මුද්‍රණය : රජයේ මුද්‍රණාලය